I·O·G·T
**Alcohol and Drug Information Centre**
ADIC

*No.40/18, Park Road, Colombo 5, Sri Lanka.*
*Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484*
*E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk*
*Web Site: http://www.adicsrilanka.org*

**මාධ්‍ය නිවේදනය**

**2026 ලෝක දුම්කොළ නිවාරණ දිනය**

**<u>“ශ්‍රී ලංකාවේ අනාගතය දුම්කොළ හානිවලින් සුරක්ෂිත කිරීම සඳහා වඩාත් ශක්තිමත් සහ ප්‍රගතිශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වහාම අවශ්‍ය වේ.”</u>**

මෙවර ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ප්‍රකාශයට පත් කළ ලෝක දුම්කොළ නිවාරණ දින තේමාව වන්නේ **“දුම්කොළ කර්මාන්තයේ කූඨ උපක්‍රම හෙළිදරව් කරමු: දුම්කොළ සහ නිකොටින් නිෂ්පාදනයන්ට එරෙහි වෙමු”** (**“Unmasking the appeal - countering nicotine and tobacco addiction”**) යන්නයි. මේ හරහා, ලොව පුරා ක්‍රියාත්මක වන ශක්තිමත් දුම්කොළ පාලන පියවරයන් අඩපණ කරමින්, නව පරම්පරාවන් (විශේෂයෙන්ම ළමුන් සහ නව යොවුන් වියේ පසුවන්නන්) තම නිෂ්පාදන වෙත ආකර්ෂණය කර ගනිමින්, පාරිභෝගිකයන් ලෙස රඳවා තබාගැනීමට, දුම්කොළ කර්මාන්තය සිය නිෂ්පාදන අලුත් මුහුණුවරකින් ප්‍රතිනිර්මාණය කරමින් සිදු කරන කූඨ උපක්‍රම හෙළිදරව් කිරීමට අපේක්ෂා කෙරේ. දුම්කොළ කර්මාන්තය විසින් "හානි අවම කිරීමේ" උපාය මාර්ග ලෙසත් දුම්පානයට වඩා ආරක්ෂිත විකල්පයන් ලෙසත් ඊ-සිගරට් වැනි නිෂ්පාදන දිගින් දිගටම ප්‍රවර්ධනය කරමින් පවතී. මෙම උපාය මාර්ග විශේෂයෙන් තරුණයින් අතර, වක්‍රව දුම්කොළ සහ නිකොටින් භාවිතය දිරිමත් කරන අතර, කර්මාන්තයට වාසිදායක වන පරිදි පාරිභෝගිකයන් රඳවා තබාගැනීමට උපකාරී වේ. නවීන, අඩු අවදානම් සහිත නිෂ්පාදන ලෙස ඊ-සිගරට් ආදිය ප්‍රවර්ධනය කරමින්, දුම්කොළ කර්මාන්තය එහි ප්‍රතිරූපය නැවත ගොඩනඟා ගැනීමටත්, එහි වෙළඳපොළ පුළුල් කිරීමටත් උත්සාහ දරන අතර, නිකොටින් නිෂ්පාදන මත පාරිභෝගිකයන් අඛණ්ඩව යැපීම හරහා දිගුකාලීන ලාභ සුරක්ෂිත කර ගැනීම ඔවුන්ගේ අරමුණයි.

දුම්පානයේ ආර්ථික සහ සෞඛ්‍යමය බලපෑම ඉතා විශාල වන අතර, එය සෑම වසරකම වළක්වා ගත හැකි මරණ **20,000 කට** පමණ හේතු වේ. තවද, දුම්කොළ භාවිතය බෝ නොවන රෝග වැළඳීමට බලපාන ප්‍රධාන අවදානම් සාධක හතරෙන් එකක් ලෙස හඳුනාගෙන ඇති අතර, රටේ සෞඛ්‍ය බර තවදුරටත් තීව්‍ර කරමින්, ශ්‍රී ලංකාවේ සමස්ත මරණවලින් **83%** කට බෝ නොවන රෝග හේතු වේ. එමෙන්ම, ශ්‍රී ලාංකිකයන් දිනකට සිගරට් සඳහා පමණක් **රුපියල් මිලියන 520** ක් වැනි දැවැන්ත මුදලක් වැය කරන අතර, ආහාර, අධ්‍යාපනය වැනි පවුලක මූලික අවශ්‍යතා සඳහා වෙන් කළ යුතු මුදල් මේ වෙනුවෙන් නාස්ති කිරීම හේතුවෙන්, දැනටමත් ආර්ථික වශයෙන් පීඩාවට ලක්ව ඇති පවුල් දරිද්‍රතාවයේ පතුලටම ඇද දමයි. තවද, 2019 වසරේදී රජය විසින් උපයා ගන්නා ලද සිගරට් බදු ආදායම රුපියල් බිලියන 92.9 ක් වුවද, දුම්පානය හේතුවෙන් රජයට දැරීමට සිදු වූ සෞඛ්‍ය සහ ආර්ථික පිරිවැය **රුපියල් බිලියන 214** ක් විය. එය සිගරට් සුරාබදු බද්දෙන් උපයන ලද ආදායම මෙන් දෙගුණයකටත් වඩා වැඩි අගයකි. මෙම සෞඛ්‍ය හා ආර්ථික ප්‍රතිවිපාක, ශ්‍රී ලංකාව තුළ ශක්තිමත් සහ තිරසාර දුම්කොළ පාලන පියවරයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ හදිසි අවශ්‍යතාව අවධාරණය කරයි.

**ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලනය පිළිබඳ නීතිමය රාමුවෙහි (FCTC) 6 වන වගන්තිය** මඟින් ද දුම්කොළ නිෂ්පාදනයන්ට ඇති ඉල්ලුම අඩු කිරීම සඳහා මිල සහ බදු පියවරයන් ඵලදායී ලෙස භාවිත කිරීමට රටවල් දිරිමත් කරයි. සිගරට් බදුකරණයේ සාර්ථකත්වය තහවුරු කරමින්, **2023 වසරේදී සිදුකල 20% ක සිගරට් බදු වැඩි කිරීමෙන් පසුව, අලෙවිය සිගරට් මිලියන 521.5 කින් (2022 ට සාපේක්ෂව 18% ක අඩුවීමක්) පහත වැටුණු අතර, ඒ සමඟම රජයේ බදු ආදායම රුපියල් බිලියන 7.7 කින් ඉහළ ගියේය** *(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු දත්ත සහ සංඛ්‍යාලේඛන)*. එහෙත්, 2024/25 කාලය තුළ බොහෝ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන්හි මිල සහ බදු වැඩිවූ නමුත්, 2025 වර්ෂයේ සිගරට් බදු වැඩි වීමේ මන්දගාමී බව නිසා පසුගිය වසර ගණනාවක් පුරා පැවත ආ සිගරට් නිෂ්පාදනය පහළ යාමේ ප්‍රවණතාවයට අභියෝග කරමින් 2025 වසර තුළ සිගරට් නිෂ්පාදනයේ 5% ක වැඩිවීමක් සිදුව ඇත.

තවද, **ඒකල ලෙස සිගරට් අලෙවිය තහනම් කිරීම** සහ **සරල ඇසුරුම් හඳුන්වා දීම** වැනි දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී (NATA) පනතේ ප්‍රධාන සංශෝධන ක්‍රියාත්මක කිරීම වසර අටකට ආසන්න කාලයක් තිස්සේ ප්‍රමාද වෙමින් පවතී. එමෙන්ම, 2025 වසරේදී **ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය** විසින් ඉදිරිපත් කරන ලද **“දුම්කොළ වලින් නිදහස් වූ පරපුරක්” (Tobacco-Free Generation)** සඳහා වන ප්‍රතිපත්ති යෝජනාව, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පිළිගෙන තිබියදීත්, මෙතෙක් කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැත. දුම්කොළ සමාගම් විසින් සිදු කරන අවිධිමත් බලපෑම්, අසත්‍ය ආර්ථික විශ්ලේෂණ, විවිධ තෙවන පාර්ශවයන්ගේ බලපෑම සහ රැවටිලිකාර පණිවිඩ හරහා මෙම ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අඩපණ කිරීමට හෝ ප්‍රමාද කිරීමට නිරන්තරයෙන් කටයුතු කරමින් සිටී.

මෙවැනි පසුබිමක, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA), ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය (NDDCB) සහ පුනරුත්ථාපන කාර්යාංශය යන ආයතන තුන එකම ආයතනයක් යටතට ඒකාබද්ධ කිරීමට ගෙන ඇති යෝජනාව පිළිබඳව ADIC ආයතනය සිය බලවත් කනස්සල්ල පළ කරයි. එවැනි ඒකාබද්ධ කිරීමක් මඟින් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතු ස්වාධීනත්වය, කාර්යක්ෂමතාව සහ එහි ඇති සුවිශේෂී බව අඩපණ විය හැකි බව අප ස්ථිරවම විශ්වාස කරමු.

2006 අංක 27 දරන පනත යටතේ ස්ථාපිත කරන ලද NATA ආයතනය, දුම්කොළ සහ මද්‍යසාර භාවිතය නිසා ඇති වන සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික හානිවලට විසඳුම් සෙවීම සඳහාම සුවිශේෂී වූ ආයතනයකි. එය ප්‍රතිපත්ති ප්‍රවර්ධනය, බදුකරණ සහය, නියාමනය, මහජන දැනුම්වත් කිරීම සහ කර්මාන්ත මැදිහත්වීම්වලින් ආරක්ෂා වීම වැනි සාක්ෂි මත පදනම් වූ මහජන සෞඛ්‍ය පියවරයන් ක්‍රියාත්මක කරයි. දුම්කොළ සහ මද්‍යසාර යනු ලොව පුරා ක්‍රියාත්මක වන, වාණිජමය වශයෙන් අතිශය ආක්‍රමණශීලී සහ රැවටිලිකාර ලෙස ක්‍රියා කරන කර්මාන්ත දෙකක් බැවින්, ඒවායේ පාලනය සඳහා, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය පාලනය සහ පුනරුත්ථාපන සේවාවලට වඩා වෙනස් වූ, සුවිශේෂී ප්‍රතිපත්තිමය සහ නිවාරණ ප්‍රවේශයන් අවශ්‍ය වේ. යෝජිත ඒකාබද්ධ කිරීම හරහා, NATA ආයතනය සතු ස්වාධීන බලය දුර්වල විය හැකි අතර, එකිනෙකට වෙනස් නීතිමය රාමු සහ ආයතනික අරමුණු හේතුවෙන් පරිපාලනමය ගැටලු, ප්‍රමාදයන් සහ විවිධ අවිනිශ්චිතතාවන් මතු විය හැකිය. වඩාත්ම වැදගත් කරුණ වන්නේ, දුම්කොළ පාලනය සඳහාම වෙන්වූ කැපවූ අධිකාරියක් දුර්වල කිරීම, WHO FCTC සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව සතු ජාත්‍යන්තර බැඳීම්වලට සහ විශ්වසනීයත්වයට ද දැඩි ලෙස බලපානු ඇති වීමයි. මෙම කර්මාන්තවල අඛණ්ඩ ප්‍රතිරෝධයන් සහ බාධා කිරීම් මධ්‍යයේ NATA ආයතනය ස්ථාපිත කිරීම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, සිවිල් සංවිධාන, විද්වතුන්, ප්‍රජා ක්‍රියාකාරීන් සහ ආගමික නායකයින් විසින් දශක ගණනාවක් තිස්සේ අඛණ්ඩව ගෙන ගිය කැපවීමේ සහ අරගලයේ ප්‍රතිඵලයක් බැවින්, **මෙම පනත සහ එහි විධිවිධාන කිසිඳු තත්ත්වයක් යටතේ දුර්වල කිරීමට ඉඩ නොතබා සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කළ යුතු බව ADIC ආයතනය පැහැදිලිව අවධාරණය කරනු ලබයි.**

තවද, ශ්‍රී ලංකාව තුළ ''දුම්කොළ වලින් නිදහස් වූ පරපුරක්'' යන ප්‍රතිපත්තිය හඳුන්වා දීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට ADIC ආයතනය සිය පූර්ණ සහය පළ කරයි. 2025 මැයි මාසයේදී, දුම්කොළ, මද්‍යසාර සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය පිළිබඳ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ විශේෂඥ කමිටුව විසින් **2010 වසරෙන් පසුව උපත ලැබූ සියලුම පුද්ගලයින් සඳහා දුම්කොළ භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් කරමින් "දුම්කොළ වලින් නිදහස් වූ පරපුරක්"** බිහි කිරීමේ යෝජනාව සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මානව හිමිකම්, සමාජ සාධාරණත්වය සහ සදාචාරාත්මක වගකීම යන මූලධර්ම මත පදනම් වූ මෙම ප්‍රගතිශීලී ප්‍රතිපත්තිය මඟින්, අනාගත පරම්පරාවන්ට දුම්කොළ නිෂ්පාදන විකිණීම නීතියෙන් තහනම් කිරීම හරහා රටින් දුම්කොළ භාවිතය ක්‍රමයෙන් තුරන් කිරීමට අපේක්ෂා කරයි. එබැවින් මෙම ප්‍රතිපත්තිය, රටට දිගුකාලීන සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික ප්‍රතිලාභ ළඟා කර දෙන නිර්භීත මෙන්ම ඉදිරි දැක්මක් සහිත මහජන සෞඛ්‍ය පියවරක් වනු නොඅනුමානයි.

එබැවින්, අනාගත පරම්පරාවන් දුම්කොළ හානිවලින් සහ කර්මාන්ත මැදිහත්වීම්වලින් ඵලදායී ලෙස ආරක්ෂා කරමින්, සැමට සෞඛ්‍ය සම්පන්න, ආරක්ෂිත අනාගතයක් සහතික කිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන නිර්දේශ වහාම ක්‍රියාත්මක කරන ලෙස අප ඉල්ලා සිටිමු:

- **රටේ උද්ධමනය සහ පුද්ගල ආදායම් වර්ධනයට සාපේක්ෂව දුම්කොළ බදු වහාම ඉහළ දැමීම.**
- **වඩාත් විනිවිදභාවයකින් යුත්, ඒකාකාරී දුම්කොළ බදු ව්‍යුහයක් හඳුන්වා දීම.**
- **NATA පනතට යෝජිත සංශෝධන (ඒකල වශයෙන් සිගරට් අලෙවිය තහනම් කිරීම සහ සරල ඇසුරුම් හඳුන්වා දීම) ඵලදායී ලෙස බලාත්මක කිරීම.**
- **"දුම්කොළ වලින් නිදහස් වූ පරපුරක්" යන ප්‍රතිපත්තිය කඩිනමින් නීතිගත කර ක්‍රියාත්මක කිරීම.**
- **දුම්කොළ පාලන ක්‍රියාවලිය තුළ "හානිය අවම කිරීමේ"** ව්‍යාජ මතවාද ප්‍රතික්ෂේප කිරීම
- **දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA), ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය (NDDCB) සහ පුනරුත්ථාපන කාර්යාංශය එකම ආයතනයකට ඒකාබද්ධ කිරීමේ යෝජනාව අත්හිටුවීම.**
- **දුම්කොළ සමාගම්වල මෙහෙයවීම් සහ කූට උපක්‍රමවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සහ ප්‍රජා ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කිරීම.**

**2026 ලෝක දුම්කොළ නිවාරණ දිනය** නිමිත්තෙන්, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) ප්‍රතිපත්ති සම්පාදකයින්, සෞඛ්‍ය වෘත්තිකයන්, සිවිල් සංවිධාන සහ සමස්ත මහජනතාවගෙන් ඉල්ලා සිටින්නේ දුම්කොළ භාවිතය නිසා ඇති වන විනාශකාරී හානිවලින් වර්තමාන සහ අනාගත පරම්පරාවන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව සතු කැපවීම තවදුරටත් ශක්තිමත් කරන ලෙසයි.

**මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)**